www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකික සොල්දාදුවෝ උතුරේ මෙහෙයුමෙන් මරනයට පත්වෙති

## Thousands of Sri Lankan soldiers perish in northern offensive

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2009 පෙබරවාරි 2**

බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ශ්‍රී ලංකා ආන්ඩුව විසින් දැන් ගෙන යනු ලබන මිලිටරි මෙහෙයුම උතුරේ වන්නි ප්‍රදේශයේ දැවැන්ත මානුෂීය අර්බුදයක් මතු වී ඇතුවා පමනක් නොවේ. එක්සත් ජාතීන්ගේ ඒජන්සි අනතුරු අඟවා ඇත්තේ අවම තරමින් දෙමල සිවිල් වැසියන් 250,000ක් වත් හිසට වහලක් හෝ ප්‍රමානවත් ආහාර නොමැතිව එම ප්‍රදේශය තුල කොට වී සිටින බව යි.

සියල්ලන් ම පාහේ දුගී ගම්බද තරුනයින්ගෙන් සමන්විත, දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකික සොල්දාදුවෝ ද, යුද පෙරමුනුවල දී මරුමුවට ලක්ව ඇත. යුද්ධය ජය ගැනීම පිනිස මංමුලා සහගතව සිටින ආන්ඩුව සහ මිලිටරිය, රැකියා විරහිත තරුනයින් දස දහස් ගනනින් බඳවා ගෙන මාස තුනක් හෝ හතරක් පමනක් වන පුහුනුවකින් පසුව යුද්ධ කරමින් මරනයට ගොදුරු වීම සඳහා ඔවුන් යුද පෙරමුනට යවා ඇත.

ජනාධිපති මහින්ද රාජපක්ෂ ආන්ඩුව, යුද්ධයෙන් සිදු වන සිවිල් ජීවිත හානි යටගැසීමට උත්සාහ දරා ඇත්තේ යම් සේ ද, එලෙසම, එය සොල්දාදුවන්ගේ මරන සංඛ්‍යා ද වසං කර ඇත. පසුගිය ඔක්තෝබරයේ දී, ආරක්ෂක අමාත්‍යාංශය ''ආරක්ෂක හේතු'' හුවා දක්වමින් සොල්දාදුවන්ගේ ජීවිත හානි ගැන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීම නතර කලේ ය.

මාස තුනක් ඇතුලත සොල්දාදුවන් 15,000ක් මරනයට ගොදුරු වී ඇතැයි විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) කර ඇති කියාපෑමක් ගැන පසුගිය මාසයේ දී සන්ඩේ අයිලන්ඩ් වාර්තාකරුවෙක් රජයේ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ලගෙන් විමසීය. එතරම් සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්ව ඇති බව ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ කල, රඹුක්වැල්ල මෙසේ ප්‍රකාශ කලේයඃ ''අපගේ තක්සේරුවලට අනුව 2008 ඔක්තෝබර් මස සිට මේ දක්වා සොල්දාදුවන් 3,000ක් පමන ක්‍රියාන්විතයේ දී මරනයට පත් වෙලා තියෙනවා.''

මෙම අඩු සංඛ්‍යාව සත්‍ය වුව ද, මිලියන 20ක පමන ජන සංඛ්‍යාවක් වෙසෙන රටක යන්තම් මාස තුනක දී තරුන සොල්දාදුවන් මෙතරම් සංඛ්‍යාවක් මරනයට පත්වීම තැති ගන්වන සුලු කාරනාවකි. ඉහල මරන සංඛ්‍යාව, තමන් නියෝජනය කරනවායි කියාපාන සිංහල දුගී ජනයා ඇතුලු, මිනිස් ජීවිත ගැන ආන්ඩුවේ පරිපූර්න නොතැකීම පෙන්නුම් කරන අතරම, දිවයින පුරා පවුල් මත යුද්ධයේ විනාශකාරී සමාජ බලපෑම පිලිබඳව ද අවධානය යොමු කරයි.

රඹුක්වැල්ලගේ ප්‍රකාශයෙන් දින කිහිපයකට පසුව, හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර වාර්තාකරුවන්ට පැවසුවේ පසුගිය වසර තුන ඇතුලත එල්ටීටීඊයට ජීවිත 13,000ක් අහිමි වී ඇති අතර හමුදා භටයින් 3,700ක් සටන්වල දී ජීවිතක්ෂයට පත් වූ බව ය. බ්‍රිගේඩියර්වරයාගේ ඇස්තමේන්තුව හමුදාවේ මරන සංඛ්‍යාව යටගැසීම සඳහා කඩිමුඩියේ කල ඉදිරිපත් කිරීමක් බව පෙනී යයි.

කෙසේවෙතත්, රට පුරාම නිවෙස්වලට, සොල්දාදුවන්ගේ මිනී පෙට්ටි ලගාවෙමින් පවතී. ආන්ඩුව, වතාවතක් හැටියට, ජීවිතක්ෂයට පත් වූ හමුදා භටයින් ''රනවිරුවන්'' ලෙස විස්තර කරන නමුත්, ඔවුන්ගේ පවුල් තම ආදරනීයයන් හා උපයන්නන් අහිමිවීමෙන් ගැඹුරු ලෙස වේදනාවට පත්ව සිටිති.

පසුගිය සතියේ දී, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ)* වාර්තාකරුවෝ යුද පිටියේ මරනයට ගොදුරු වූ සමහර හමුදා භටයින්ගේ පවුල් සහ හිතවතුන් මුන ගැසීමට ගියහ. එම තරුනයන්ගෙන් බොහෝ දෙනෙක් ගම්බද පලාත්වලින් පැමිනි අතර දරුනු දිලිඳුකම සහ විරැකියාව නිසා හමුදාවට බැඳී ඇත. නිවෙස් වෙත පැමිනි අවස්ථාවන්හි දී මොවුන් බොහෝ දෙනෙක් තම පවුල්වලට මෙසේ පවසා තිබුනිඃ ''මේ මම ඔයගොල්ල දකින අන්තිම වතාව වෙන්න පුලුවන්.''

මුහමාලේ යුද පෙරමුනේ දී මිය ගිය 25 වියැති කෝප්‍රල් ජී. දිනේෂ් ප්‍රියංකර පෙරේරාගේ අවමංගල්‍යය ජනවාරි 10 දින කොලඹින් කි.මී. 27ක් දකුනින් පිහිටි පානදුරේ දී පැවැත්වින. ''ස්වර්න භූමි පුත්‍රයෙක්'' ලෙස ඔහුගේ මරන දැන්වීමෙහි ඔහු විස්තර කර තිබුනි.

දෙමව්පියන් තම තීරනයට විරුද්ධ විය හැකි යයි සිතා ඔවුන්ට නොදන්වා ඔහු හමුදාවට බැඳී තිබුනු බව, පෙරේරාගේ මවත් සහෝදරියත් ලෝක සමාජවාදී

වෙබ් අඩවියට පැවසූහ. 2006 දී දකුනු ශ්‍රී ලංකාවේ පිහිටි බූස්ස කඳවුරේ මාස 4ක පුහුනුවකින් පසුව, ඔහු කෙලින්ම යුද පෙරමුනට යවන ලදි. හමුදාවෙන් නිදහස් වීමට ගෙවිය යුතු බැඳුම්කර මුදල් සොයා ගැනීමට තමන්ගේ නිවෙස විකිනීමට ඉදිරිපත් වෙමින් දෙමව්පියන් ඔහුගෙන් එහි නොයන ලෙසට උදක් ම ඉල්ලා සිටිය ද, ඔහු ඊට එකග නොවීය.

මෙම පවුල ජීවත් වන්නේ කපරාදු නොකරන ලද කුඩා ගෙයක ය. පෙරේරාගේ මව රැකියාවක් නොකරන අතර පියාට රැකියාව අහිමි වී ඇත. සහෝදරියන් දෙදෙනාම කසාද බැඳ ඇති අතර පවුල සඳහා වෙනත් ආදායම් මාර්ගයක් නොමැත.

ඔහුගේ මව මෙසේ පැවසුවාය: ''අපේ ගේ උකසට තියලයි තියෙන්නෙ. බැංකුවට ගෙවන්න මගේ පුතා හැම මාසෙම රුපියල් 10,000ක් (ඇ.ඩො. 90 පමණ) එව්වා. ගෙයක් නැති එයාගෙ සහෝදරීට ගෙයක් හදලා දෙන්න එයාට ඕන වුනා.'' කඳුලු සලමින් ඇය තව දුරටත් මෙසේ කීවාය: ''එයා අපට තාත්තා කෙනෙක් වගේ. එයාගෙ අක්කගේ ගෙදර වහල හදාගන්න එයා රුපියල් 40,000ක් දුන්නා. දැන් අපට ජීවත් වෙන්න විදියක් නැහැ.''

ඇය මෙසේ ද පැවසුවාය: ''මට මගේ පුතා නැතිවුනේ මේ යුද්දෙ නිසා. එයාගෙ මරනෙට ආපු එක සොල්දාදුවෙක් මට පොරොන්දු වුනා නිතරම අපිව බලන්න එනව කියලා. ඒත් සතියකට පස්සේ එයාගෙ කකුල නැතිවුනා. අපි දන්නෙ නැහැ මොනව කරන්නද කියලා, ඒ ගොල්ල වෙනුවෙන් යාඥා කරනවා ඇරෙන්න.''

අවසාන වරට ජනවාරි 5 දා පෙරේරා නිවසට දුරකථනයෙන් අමතා තිබුනි. එවිට ඔහු සිටියේ බංකරයක් තුලය. ඔහුගේ මව මෙසේ පැවසුවාය: ''අපේ පුතා යුද පෙරමුන ගැන කිසි දෙයක් කිව්වේ නැහැ, මොකද ඒක තහනම් නිසා.''

පෙරේරාගේ මරනය ගැන සිය පවුලට දැනුම් දීම සඳහා පොලීසිය ගෙදරට පැමිනි විට ඔවුන් සතුව 10 දෙනෙකුගේ ලැයිස්තුවක් තිබින. පෙරේරාගේ ඥාතියෙක් ඒ සම්බන්ධයෙන් මෙසේ අදහස් දැක්වීය: ''එදාම පානදුර ප්‍රදේශයට සොල්දාදුවො 10 දෙනෙකුගේ මිනී පෙට්ටි ගෙනාපු බවයි ඒකෙන් පේන්නෙ.''

තවත් හමුදා භටයකු වූ බදුල්ල දිස්ත්‍රික්කයේ ජානක, දෙසැම්බර් 10 දා, එල්ටීටීඊයේ පැවති පරිපාලන අගනුවර වූ කිලිනොච්චිය සඳහා කරන ලද සටනේ දී බරපතල ලෙස තුවාල ලැබීය. දකුනු පලාතේ පිහිටි ගාල්ල රෝහලට ඇතුලත් කරනු ලැබුව ද පසුව ජනවාරි 8 දා ඔහු තුවාලවලින් මිය ගියේය.

ජානක විවාහ වූවෙකි. ඔහු සහ ඔහුගේ බිරිඳ යන දෙදෙනා ම තම මවත් සහෝදරියන් දෙදෙනාත් සමග මැටිවලින් තනන ලද තනි කාමරයක් සහිත කුඩා නිවසක ජීවත් විය. එක් සහෝදරියකට අවුරුදු 17ක් ද අනෙකාට අවුරුදු 19ක් ද වෙයි. පවුලේ සාමාජිකයින්ට අනුව, ජානක තුවාලවූවායින් පසුව ඔහුට සිය වැටුප ලැබුනේ නැත.

මධුසන්ක රුවන් නම් තවත් සොල්දාදුවෙක් මුලතිව් සඳහා කරන ලද සටනේ දී තුවාල ලබා ජනවාරි 27 දා නිවසට ගෙන එන ලදී. පවුලේ සාමාජිකයෝ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසූහ: ''රට ජාතිය ආරක්ෂා කරනවා කියමින් මේ ආන්ඩුව තරුනයො මරනයට තල්ලු කරනවා.'' රුවන්ගේ සහෝදරිය එයට මෙසේ එකතු කලාය: ''අපට ජීවත් වෙන්න වෙන විධියක් නැති නිසා මගේ අයියා හමුදාවට බැඳුනා. අපට වගා කරන්න ඉඩම් නැහැ. ආන්ඩුව යුද්දෙට විශාල මුදලක් වියදම් කරනවා. අපි මේ යුද්දෙට කැමැති නැහැ.''

මහනුවරට කිට්ටු ගම්පොල විසූ චරිත් ප්‍රියන්ත ජනවාරි 21 දා කිලිනොච්චි යුද පෙරමුනේ දී ජීවිතක්ෂයට පත් විය. ඔහුගේ කතාව ද අනෙක් ඒවාට සමාන විය. මාස දෙකකට පෙරාතුව නිවෙස වෙත පැමිනි අවස්ථාවක ඔහු තම පවුලට සහ හිතවතුන්ට පැවසුවේ යුද්ධය ''ඉතා අමාරු'' බවත් පන පිටින් නැවත පැමිනීම ගැන තමන්ට විශ්වාස නැති බවත් ය.

ආන්ඩුව පිලිගෙන ඇති සංඛ්‍යාවට වඩා සැබෑ මරන සංඛ්‍යාව වැඩි බවට හමුදා භටයින්ගේ පවුල් අතර සැකයක් පවතී. සමහර වාර්තාවන්ට අනුව, සැබෑ තත්වය වසන් කරනු පිනිස, ආන්ඩුව සියලු මල සිරුරු ඔවුන්ගේ නිවෙස් වෙත එවා නැත.

තවත් දහස් සංඛ්‍යාත සොල්දාදුවන් සංහාරයෙන් බේරීම සඳහා හමුදාව හැර දමා ගොස් ඇත්තේ, නිදහස් දිනය වන පෙබරවාරි 4 දා හැරගියවුන්ට රාජ්‍ය සමාවක් දීමට ආන්ඩුවට බල කරමිනි.

එලෙස හමුදාව හැර දමා ගොස් ඇති පුත්තලම් දිස්ත්‍රික්කයේ සොල්දාදුවෙක් මෙසේ පැහැදිලි කලේය: ''අවුරුදු තුනකට කලින් මම (හමුදා) ස්වේච්ඡා බලකායට බැඳුනා. සොල්දාදුවන් විශාල සංඛ්‍යාවක් මරනයට පත් වුනු නිසා මම හමුදාව දාලා ආවා. ස්වේච්ඡා භටයින් ලෙස අපගේ රාජකාරිය වී තිබුනේ මුදා ගන්නා ලද ප්‍රදේශ රැක ගැනීමට යි. ඒත් සොල්දාදුවන්ගේ හිඟය නිසා ඉහල නිලධාරීන් අපේ සමහර අයත් යුද පෙරමුනට යැව්වා. ඒක නිසා මම පැනලා ආවා.''

ඔහු තව දුරටත් මෙසේ පැවසීය: ''මගේ තාත්තා අසනීපෙන්, කිසි වැඩක් කරන්න බැහැ. මට දූලා දෙන්නෙක් ඉන්නවා. එක්කෙනෙකුට අවුරුදු 8 යි, අනෙක් කෙනාට 4 යි. මගේ බිරිඳට තවත් දරුවෙක් ලැබෙන්න ඉන්නවා. අපට ම කියල ගෙයක් නැහැ. අපි ජීවත් වෙන්නේ නෑදෑයින්ගේ ගෙවල්වල. පොලීසිය මාව අත් අඩංගුවට ගනියි කියල මම හැංගිලයි ඉන්නේ.

''හමුදාවට බැඳෙන්න කලින් මම ධීවරයෙක්. දැන් මට මාලු අල්ලන්න බැහැ, මට වෙන රස්සාවකුත් නැහැ. ඒක නිසා මම තීරනය කලා ආයිත් හමුදාවට යන්න.''

ජනවාරි 9 දා, *කලම්බු පේජ්* හමුදාව හැරගියවුන් සිරගත කිරීම ගැන වාර්තා කලේය. බන්ධනාගාර කොමසාරිස්, මේජර් ජෙනරාල් වජිර විජේගුනවර්ධන මාධ්‍යයන්ට ප්‍රකාශ කලේ හමුදා අධිකරනයේ නඩු විභාගවලින් අනතුරුව හමුදාව හැරගියවුන් 2500ක් සිරගෙයි සිටින බවය. තවත් 4000ක් තවමත් නඩු විභාගයන්ට ලක් කිරීමට නියමිතව සිටියි. හමුදාව විසින් ප්‍රදානය කරන ලද සමාවට ප්‍රතිචාර දක්වමින් නැවත පැමින ඇත්තේ 3000ක් පමනි. එලෙස ආපසු පැමිනි අය යලි යුද පෙරමුනට යවා ඇත.

නිලධාරියෙක්, හැරගියවුන් රඳවා ඇති කඳවුරක් පිලිබඳව *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසීය: '' හමුදාවෙන් පැනල ගිය අය 80ක් එක ගොඩේ දාලා තිබුනු පුංචි කාමරයක් මුර කරමින් කොලඹ තියෙන අපේ කඳවුරේ මම සති දෙකක් ගත කලා. ඔවුන්ට අඳින්න අවසර දී තිබුනේ කොට කලිසම් විතරයි.

''ඒගොල්ලන්ට දවසකට දෙන්නේ එක බත් වේලයි, උදේටයි රෑටයි පාන් පෙති 2ක් එක එලවලුවකුයි පරිප්පුයි එක්ක. ඔක්කොටම පාවිච්චි කරන්න වෙන්නෙ ගඳ ගහන එක් වැසිකිලියක් විතරයි. මොන තරම් වධයක්ද ඔවුන් විඳින්නේ. දවස් 40කට පස්සෙ ඔවුන් හමුදා අධිකරනයට යවලා සෑහෙන කාලයකට හිරේ යවනවා. (කොලඹ පිහිටි) වැලිකඩ හිරගෙදර ඒ වගේ හිරකාරයෝ කිහිප දහසක් ඉන්නවා.''

සිවිල් ජනයාගේ මෙන්ම හමුදා භටයින්ගේ ද මරන සංඛ්‍යාව ඉහල යද්දී, එය නොතකා, ආන්ඩුව ප්‍රකාශ කර ඇත්තේ හමුදා ප්‍රහාරවල කිසිදු සැර බාල කිරීමක් නොකරන බවයි. කාලතුවක්කු ප්‍රහාරවලින් සිය ගනන් දෙමල සිවිල් ජනතාව ඝාතනයට ලක්ව දහස් ගනනක් තුවාල ලබා ඇති බවත් ගැටුම්වලට මැදි වී සිටින මිලියන කාලක් පමන වන සිවිල් ජනයා මත මානුෂීය ව්‍යසනයක් කඩාපාත් වෙමින් පවතින බවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වාර්තා කිරීමෙන් පසුව, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසුගිය සිකුරාදා ''මානුෂීය සටන් විරාමයක්'' සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් ඉවත දැම්මේ ය.

© www.wsws.org